# ඓතිහාසික දිඹුලාගල ආශ්‍රිත ඉපැරණි ජනාවාස හා ආදිවාසි ජන සමාජය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ.කේ.ජී.කේ.එම්. සෙනරත්

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
kushanisenarath966@gmail.com

**මුඛ්‍ය පද** - වැදි ජනතාව, දිඹුලාගල, ඓතිහාසික.

## හැඳින්වීම

දිඹුලාගල හෙවත් උදුම්බරගිරි කඳු වැටිය මෙරට ආදිත ම යුගයේ හෙවත් ප්‍රාග් ඓතිහාසික අවදියේ පටන් මධ්‍යතන අවදිය දක්වා වරින් වර ජනාවාස වූ ප්‍රදේශයක් වශයෙන්, මෙන්ම වෙනත් බෞද්ධාගමික කටයුතු හෝ භික්ෂු ආවාස වශයෙන් පවතින්නට ඇතැයි යන්න පරණවිතානයන්ගේ අදහසයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් මානව ක්‍රියාකාරකම් පිළිබඳව සාධක අනාවරණය කෙරෙන මෙහි ස්වභාවිකව නිර්මාණය වූ ගුහා ආවරණ සහ ස්වභාවික ජල මූලාශ්‍රයන් ආශ්‍රිතව කඳුගැට මෙන්ම ස්වභාවික ගල් ගුහා උපයෝගී කර ගනිමින් ආදි මානවයා වාසය කළ බවට සාධක අනාවරණය වීම් ද හඳුනාගත හැක. යක්ෂයන්ගෙන් උද්භේද වූ වැදි ජනයාගෙන් පැවත එන ජන කණ්ඩායම් වර්තමානය වන විටත් දිඹුලාගල වාසය කරන බව හඳුනා ගත හැක. මෙසේ පවත්නා වූ ජන සමාජ ක්‍රමයේ ව්‍යාප්තිය සහ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම සාකච්ඡාවේ මුඛ්‍ය පරමාර්ථය බවට පත් වේ. වත්මන් සමාජ ක්‍රමවේදය හමුවේ දිඹුලාගල ආශ්‍රිත සමාජය කෙමෙන් කෙමෙන් නූතන සමාජ ක්‍රමයක් දක්වා සිදු වන පරිවර්තනයන් හමුවේ පැවති ආදිවාසී සමාජ ක්‍රමය මේ වන විටත් ඉතාම සීඝ්‍රයෙන් වියැකී යමින් පවතී. මේ නිසාවෙන් ම වියැකී යන ආදිවාසී ජන සමාජීය ලක්ෂණ, සමාජ ව්‍යාප්තිය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

## ක්‍රමවේදය

ඉහතින් දැක්වූ පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය තොරතුරු සපයා ගැනීමට මූලිකව ම සාහිත්‍යයමය මූලාශ්‍ර ඔස්සේ පූර්ව අධ්‍යයනයන් විය. එසේම අභිලේඛනමය මූලාශ්‍රයන්, කටවහර, පැරැණ්නන්ගේ අදහස් හා මත ආදී ක්‍රමවේද භාවිතය මඟින් මෙම අධ්‍යයනය සඳහා කරුණු අනාවරණය කර ගන්නා ලදි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් අද දක්වා මානව ක්‍රියාකාරකම් වන්නා වූ ඉතා දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියනු ලබන්නක් වන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ශේෂ කඳු පද්ධතියට අයත් මුහුදු මට්ටමේ සිට අඩි 1735 ක් ඉහළට නැගෙන දිඹුලාගල තදාශ්‍රිත ප්‍රදේශයේ වාසය කළ ප්‍රාථමික ජන කණ්ඩායම් මහාවංසයේ එන පණ්ඩුකාභය සමය දක්වා විහිදෙන ඉතිහාසයක් හිමි කර ගනී (මහාවංසය, පරි.10: ගා. 53-58). මහා පරාක්‍රමබාහු රජ දවස පැවති යුධ කාර්යයන්වල දී වැඩි වශයෙන් ඒ සඳහා මෙම කලාපයේ ජීවත් වූ වැදි ජනයා උපකාර වී ඇති බවත් එහි දී එවකට "රත්ථවාසික සේනා" හෙවත් "රටවැසි සේනාව" යන විරුදාවලි ලත් කොට්ඨාසයක් මෙහි සිට ඇති බවත් මොවුන් රට පුරා විවිධ ප්‍රදේශයන්ගෙන් පැමිණි ගෝත්‍රවලට අයත් පිරිස්ගෙන් සමන්විත වූ බවත් හඳුනාගත හැක. විශේෂයෙන් ම මහාවංසයේ අන්තර්ගත මෙම තොරතුරු අධ්‍යයනයෙන් පෙනී යන්නේ 12වන සියවසේ දී මේ ආශ්‍රිත වැදි ජනයාගේ බලවත් වීමක් පැවති බවයි.

මහාවංසයේ මෙලෙස සඳහන් වන අතර ආචාර්යය පී.ඊ.පී. දැරණියගලයන්ගේ අදහස වනුයේ පොළොන්නරුව මනම්පිටිය වගුරු බිම්වල සහ දිඹුලාගල වනරොද ආශ්‍රිතව වැදි ජනතාව ජීවත්ව සිට ඇති බවයි. ඒ බව ආචාර්යය ඊ.එම්. රත්නපාලයන් විසින් රචිත " ලංකාවේ වැද්දෝ" නම් කෘතියේ ඔහු විසින් ලංකා සිතියමකින් පොළොන්නරුවේ දිඹුලාගල

යක්කුරේ මුතුගල ආදී ප්‍රදේශ වැදි ජනාවාස පැවති ප්‍රදේශ බවට සිදු කොට ඇති අනාවරණයෙන් තව දුරටත් සනාථ වේ. මෙසේ පොළොන්නරුව ආශ්‍රිත වැදි ජනයාගේ නිජ බිම් වූ මනම්පිටිය, දිඹුලාගල, සොරිවිල, ඇල්ලේවැව, යක්කුරේ, කරපොළ, මුතුගල, වැලිකන්ද, කඩවත්මඩුව, දම්මින්න, නිදන්වල, කන්දේගම, ගිනිදමන, දළුකාන සහ කුඩා වැව ආදී ගම්මාන රාශියක් අතුරින් දිඹුලාගලට සුවිශේෂීත්වයක් හිමි වනුයේ එහි පවත්නා ඓතිහාසික වැදගත්කම් නිසාමය. යක්ෂයාගෙන් උද්භේද වූ වැදි ජනයාගෙන් පැවත එන්නෝ අදත් දිඹුලාගල වාසය කරයි. මෑතකාලීනව මධ්‍යම සංස්කෘතික අරමුදල පොළොන්නරුව ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද මානව වංශ අධ්‍යයනයන්ගෙන් මෙම ප්‍රදේශයේ ජීවත් වන වත්මන් ආදිවාසී ජනතාව පිළිබඳව තොරතුරු වාර්තා කොට ඇත.

මහියංගනය හා ඒ අවට ගම්වල සිට පැමිණි ආදිවාසීන් දිඹුලාගල උල්පත හා කොස්ගහ උල්පත නමින් හැඳින් වූ දිඹුලාගල පර්වතය ආසන්නයේම තම ජනාවාස ඉදි කොටගෙන ඇති අතර දිඹුලාගල වැදි පරපුරේ මුල්ම නායකයන් වශයෙන් මායාදුන්නේ වන්නියා හා රන්දුන්නේ යන දෙදෙනා හඳුනා ගැනෙන අතර මොවුන් දෙදෙනාගෙන් පැවත එන මෙම පරපුර ගිරිදමන මොල්ලිවල, මහඋල්පත සහ කළුකැලේ ප්‍රදේශවල පදිංචිව සිට ඇත. මෙම වැදි ගම්මානවල නායකත්වය මිල්ලාහ හෙවත් "යාපා" හා "පටබැද්දා" යන්නවුන් විසින් දරා ඇත. 1954 වසරේ කිතලගම ශ්‍රී සීලාලංකාර ස්වාමීන් වහන්සේගේ පැමිණීමෙන් පසු වැදි ජනයාගේ යහපත උදෙසා බොහෝ කටයුතු කොට ඇති අතර සමාජීය සංස්කෘතික වටිනාකම් ඉහළ නංවමින් ස්ථාවර ආර්ථික ජීවන ක්‍රමයකට පත් කිරීමට කටයුතු කොට ඇත. එමෙන් ම මෙම වැදි ජනතාව පිළිබඳව සිදු කරන ලද සහභාගීත්ව නිරීක්ෂණයන්ගෙන් අනාවරණය වන්නා වූ තවත් වැදගත් තොරතුරක් වනුයේ මොවුන් අද වන විටත් මෙම ප්‍රදේශ ආශ්‍රිතව මොවුන්ගේ ජීවන කටයුතු සිදු කරමින් සිටින බවයි. වර්තමානයේ දීත් දිඹුලාගල ආරණ්‍ය සේනාසනයට යන ඕනෑම අයෙකුට මෙම ආදිවාසී සම්භවයක් සහිත පුද්ගලයින් මුණගැසීමේ අවස්ථාව පවතින අතර ඇතැම් අවස්ථාවක මොවුන්ගෙන් සමහරක් ආරණ්‍යය සේනාසනය අවට ආරණ්‍යය සේනාසනයට ලැබෙන දානමාන ආදිය අපේක්ෂාවෙන් සිටින බවත් දැක ගත හැක. එමෙන් ම මෙම ආදිවාසී සම්භවයක් ඇති පුද්ගලයින්ගේ බහුතරයක් පවුල්වලින් එක් අයෙකු හෝ දිඹුලාගල ආරණ්‍යය සේනාසනයේ පැවිදි බව ලබා ගෙන සිටින බවත් හඳුනාගත හැක. මෙම ප්‍රදේශය ආශ්‍රිතව පවත්නා වූ සංවර්ධනයේ මන්දගාමී තත්ත්වය හමුවේ මේ අන්දමින් ආරණ්‍යය සේනාසනය තුළ කුඩා අවදියේ දී ම දරුවන් පැවිදි බවට පත් කරනු ලබන බව සාකච්ඡාවන්ගෙන් අනාවරණය විය. ඉහතින් දැක්වූ අන්දමින් ම මෙම ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වන්නා වූ ආදිවාසී සම්භවයක් සහිත මිනිසුන් අදටත් සේනාසනයට පැමිණෙන අයවලුන්ගෙන් ආහාරපාන ආදිය අපේක්ෂාවෙන් රැඳී සිටින ආකාරය දැකගත හැක. ඇතැම් පිරිස් මේ ආකාර වන විට ඇතැම් පිරිස් වර්තමානය වන විට ආර්ථික මට්ටමින් ස්වයංපෝෂිතව සිටින අන්දම හඳුනාගත හැක.

ඒ අනුව කාලයත් සමඟ සිදු වන නවීකරණයට හසුවන ආදිවාසී ජනතාව අද වන විට උළු සෙවිලි කළ නිවාස භාවිත කරමින් මහවැලි ව්‍යාපෘතිය තුළ දියුණු සමාජ ක්‍රමයකට ද හැඩ ගැසුණු සමාජ කොට්ඨාසයක් වශයෙන් හඳුනාගත හැක. මේ නිසාවෙන් ම මොවුන්ගේ සමාජ ව්‍යාප්තිය අධ්‍යයනය කිරීමෙන් වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කර ගැනීමට අවස්ථාව වුදා වනු ඇත.

**ආශ්‍රිත මූලාශ්‍රය**

සුමංගල හිමි, අම්බුළුගල. (2013). ***උදුම්බරගිරි වංශය සහ අස්ගිරි පුවත***, කොළඹ, දයාවංශ ජයකොඩි.

ආරියපාල, ඊ.එම්.(2003). ***ලංකාවේ වැද්දෝ***, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ.

***පුලතිසි වංශය***,(2010). කොළඹ, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය.